**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 25 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.2, 1.6.3 (අ) (ආ) , 1.6.4 (ආ) හා 1.6.7 (ඇ) ඡේදවල සඳහන් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිරීක්ෂණ සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**<br>2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිංහල පිටපත හා ඉංග්‍රීසි පිටපත 2020 ජූලි 01 දින ඉදිරිපත් කර තිබුණි. 2020 සැප්තැම්බර් 17 දින දක්වා එහි දෙමළ පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. | පරිවර්තන කටයුතු අවසන් කර ඇත. අවශ්‍ය පිටපත් ලබාගෙන විගණනය වෙත ඉදිරිපත් කළ හැක. |
| (ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය.**<br>2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් බී ගිණුම 2019 පෙබරවාරි 28 දින වන විට ඉදිරිපත් කළ යුතු වුවද 2020 ජූලි 07 දින ඉදිරිපත් කර තිබුණි. | -එම- | 2019 වර්ෂයේ අත්තිකාරම් බී ගිණුම 2019 අවසාන කාර්තුවේ දිස්ත්‍රික් කාර්යාලවලට අදාළ නිවැරදි වාර්තා 2020 මාර්තු මස මුල දක්වා ලැබී තිබුණි. එම නිසා දිස්ත්‍රික් ඇතුළුව සම්පූර්ණ ගිණුම නිම කිරීමට 2020 මාර්තු මස පළමු සතිය දක්වා දීර්ඝ වූ අතර ඉන්පසු රටේ පැවැති COVID 19 තත්වය හමුවේ අමාත්‍යාංශ ලේකම්ගෙන් ගිණුම සහතික කර ගැනීම 2020 ජුනි මස සිදුවිය. මේ ප්‍රමාදය වලක්වා ගනිමින් ඉදිරියේදී නියමිත දිනට ගිණුම ලබාදීමට කටයුතු කරමින් පවතී. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගිණුමක ලැබීම්වල රු. 652,148 ක වෙනසක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව පොදු තැන්පත් ශේෂ සැසඳිය යුතුය. | 2007 නොවැම්බර් 15 දින දක්වා ගොවිජන සංවර්ධන අරමුදල සඳහා මහජන බැංකු ගිණුම් අංක 6-1001-1673169411 යටතේ වෙනම ගිණුමක් පවත්වාගෙන ගොස් ඇති අතර 2008 වර්ෂයේදී දෙපාර්තමේන්තු ප්‍රධාන ගිණුම හා ගොවිජන සංවර්ධන අරමුදලෙහි ගිණුම ඒකාබද්ධ කොට ඇත. එසේ ඒකාබද්ධ කිරීමට පෙර මෙම රු. 651,797 ක වෙනස ඇති වී ඇති අතර මේ පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් 2019 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමෙන් පසු ලැබුණු අතර එය අධ්‍යයනය කර අවශ්‍ය ගැලපීම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් සිදු කිරීමට නියමිතය. |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව යටතේ පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 522 ක, දිස්ත්‍රික් කාර්යාල 25 ක, යාන්ත්‍රික අංගන 05 ක සහ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් මූල්‍ය නොවන වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ඉඩම් ගිණුම්ගත කළ යුතුය. | 2020 වර්ෂයේදී තක්සේරු වටිනාකම් ලද මධ්‍යස්ථාන 02 ක ඉඩම් වටිනාකම් 2020 වර්ෂයේදී ගිණුම්ගත කරන ලද අතර අනෙකුත් ඉඩම් තක්සේරු කර ඉදිරියේදී CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 409 ක, යාන්ත්‍රික අංගන 03 ක ගොඩනැගිලි වටිනාකම හා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 03 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ගොඩනැගිලි ගිණුම්ගත කළ යුතුය. | ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යස්ථාන 9 ක ගොඩනැගිලි සැලැස්මෙහි පිටපත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර මේ වන තෙක් තක්සේරු වටිනාකම් ලැබී |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| | | නොමැති බව දන්වා සිටිමි. 2020 වර්ෂයේදී තක්සේරු වටිනාකම් ලද මධ්‍යස්ථාන 02 ක ගොඩනැගිලි වටිනාකම් 2020 වර්ෂයේදී ගිණුම්ගත කරන ලද අතර අනෙකුත් ගොඩනැගිලිද තක්සේරු කර ඉදිරියේදී CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය / මුදල් රෙගුලාසි 502 (2) 11 වැනි පරිශිෂ්ටය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502 (2) 11 වැනි පරිශිෂ්ටය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය CIGAS වැඩසටහන යටතේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලබන අතර මිලදී ගන්නා වත්කම් හා අපහරණය කරනු ලබන වත්කම් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වාගත යුතුය. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමයේ උපදෙස් මත ඇප පවත්වාගෙන යන අතර ඒ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය විසින් ඇප ලේඛනය පවත්වා ගෙන යනු ලැබේ. |

### 1.6.5 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.1,656,787 ක වටිනාකම වූ වවුචර්පත් 09 ක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සියලුම ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතුය. | විගණන වාර්තාවේ සඳහන් වවුචර්පත් සොයමින් පවතී. |

**1.6.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනුලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර, ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත් වාර්තාවේ 1.6.1 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නියමිත දිනට ගිණුම ලබාදීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 සැප්තැම්බර් 15 දිනට විගණන විමසුම් 25 ක් සඳහා පිළිතුරු ලබාදීමට පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉහත විගණන විමසුමේ පෙන්වා ඇති කාර්යයන් සඳහා වෙන්කර ඇති පැය ප්‍රමාණය 2,192 ක් වුවත්, එය විගණන සැලැස්ම සංශෝධනයට පෙර දක්වා ඇති පැය ප්‍රමාණයි. 2019 වර්ෂයේ විගණන සැලැස්ම 2019 ඔක්තෝබර් 19 වන දින පැය ප්‍රමාණය 1,128 ක් ලෙස සංශෝධනය කෙරුණි. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ගොවිජන සංවර්ධන පනතේ 51(1) වගන්තිය | පනත ප්‍රකාරව ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගොවිජන සංවර්ධන සභා පිහිටුවන තෙක් කාරක සභාව මඟින් කටයුතු සිදු කරගෙන යනු ලබයි. එසේම ඉහත වගන්තිය සඳහා නියෝග සකස් කිරීම මේ වන විට අවසන් කර ගැසට්පත්‍රය පළ කිරීම සඳහා කටයුතු සූදානම් කරමින් පවතී. ඉන් පසුව සංවර්ධන සහා පිහිටුවීමට සියලු කටයුතු සූදානම් කර ඇති අතර 2020 වසර තුළ දී මෙම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | එල්ලංගා ව්‍යාපෘතියට අනුයුක්ත තාවකාලික නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකරනු ලබන සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා වූ වාරික මුදල වන රු.367,002 ක් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කම්කරු දෙපාර්තමේන්තුවට නොගෙවා ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු ගිණුම්වල අවසාන ශේෂය නියාදනය කළ යුතු වුවත් පොදු තැන්පත් ගිණුම් 04 ක 2019 දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්ම වූ රු. 40,023,045 ක තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට වසර 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා ලෙස දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර මේ පිළිබඳව 2020 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඈ) | 2018 ජනවාරි 27 දිනැති 05/2018(1) අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමට කමිටුවක් පත් කර ඇත. දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ල සෑදීමේ කටයුතු හේතුවෙන් මෙම පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමේ කටයුතු තාවකාලිකව නතර කර ඇති අතර කඩිනමින් එම කටයුතු නිම කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති 107 චක්‍රලේඛයේ 30(iii) වගන්තිය | 2016, 2017 සහ 2018 වර්ෂවලට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථාන මූල්‍ය ප්‍රකාශන 07ක් හා 2019 වර්ෂයට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථාන මූල්‍ය ප්‍රකාශන 73 ක්ද නියමිත දිනට විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | හිඟ ගිණුම් වාර්තා සියල්ල 2020 සැප්තැම්බර් 15 දිනය පෙර ඉදිරිපත් කරන ලෙස මාගේ අංක 7/5/12/ගි.වා./පොදු හා 2020 අගෝස්තු 27 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. |
| (ඊ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ග) වගන්තිය | ලංසු කැඳවීම් ලේඛනවල නිෂ්පාදන බලය පැවරීමේ ලේඛන (Manufacture Authorization) ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණු අතර එසේ නිෂ්පාදන බලය පැවරීමේ ලේඛන ඉදිරිපත් කර නොතිබුණු ආයතනයක් වෙත රු.2,760,000 ක් වටිනාකමැති වර්ෂාපතනමාන කට්ටල 150 ක් මිලදී ගැනීමේ ටෙන්ඩරය පිරිනමා තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම ප්‍රසම්පාදනයේදී එම කරුණ අතපසුවීමකින් මඟ හැරී ඇති බව දන්වා සිටිමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පියවීම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 118 ප්‍රකාරව ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී පැමිණි හා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය පිළිවෙලින් රු. 133,330 ක් සහ රු. 5,735,356 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 118 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | වැඩ තහනම් කළ, සේවය හැර ගිය, මිය ගිය, විශ්‍රාම ගිය, මුදාහැරි සහ වෙනත් ණය ශේෂවල 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 15,316,695 ක් විය. | ඇපකරුවන්ගෙන්, විශ්‍රාම වැටුපෙන්, විනය ක්‍රියාමාර්ග මඟින් වගකීම පැහැර හළ අයගෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් අනුගමනය කර අයකර ගැනීම් කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 2.2 තැන්පතු ශේෂයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 සහ 2019 වර්ෂවල පොහොර අත්තිකාරම් පියවීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් ලද රු.1,064,993 ක මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත නොගෙවා ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ මුදල් ගෙවා ගිණුම් නිරවුල් කළ යුතුය. | 2018 හා 2019 වර්ෂ වල පොහොර අත්තිකාරම් පියවීම සඳහා ලද මුදල් නිරවුල් කරන ලෙස දන්වා අදාල අංශ වෙත ලිපි යොමු කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී. |
| (ආ) | විශ්‍රාම ගිය රජයේ නිලධාරීන්ගෙන් අයකර අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ගෙවිය යුතු වූ රු.655,287 ක ණය ශේෂය මධ්‍යස්ථානවලට නොගෙවා ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පතුවල රඳවාගෙන තිබුණි | ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අදාළ මුදල් නොපමාව ගෙවිය යුතුය. | ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් වල රඳවාගෙන තිබුණු විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයකර අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට ගෙවිය යුතු රු.750,044 ක ණය ශේෂයන්ගේ 2020 සැප්තැම්බර් 10 දින වන විට කිතලව ගොවිජන සේවා කාරක සභාවට අයවීමට තිබූ රු.94,757 ක මුදල 2020 ජූලි 29 දිනැති අංක 751561 දරන චෙක්පත මගින් නිරවුල් කර ඇත. |
| (ඇ) | දිස්ත්‍රික් කාර්යාල 08 ක කොන්ත්‍රාත් රැඳවුම් රු.4,553,091ක් වර්ෂ 02 ත් 05 ත් දක්වා කාලයක් පුරා ඉංජිනේරුවරයාගේ සහ තාක්ෂණ නිලධාරියාගේ නිර්දේශ නොමැති වීම හේතුවෙන් ගෙවීම් නොකර පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. අදාළ කොන්ත්‍රාත්වල පැවති අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන හෝ සකස් නොකරන්නේ නම් එම රැඳවුම් මුදල උපයෝජනය කර එම අඩුපාඩු සම්පූර්ණ කර අදාළ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට 2019 දෙසැම්බර් 31 දින දක්වාත් කටයුතු කර නොතිබුණි. | අප්‍රමාදව ගෙවීම් සිදු කළ යුතුය. | 2020 අගෝස්තු වන විට රු.4,097,307 ක ශේෂය නිරවුල් කර ඇත. ඉතිරිව ඇති රු.455,784 ක ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ කුලියට දී ලබාගත් මුදල් ප්‍රධාන කාර්යාලයට එවිය යුතු වුවත් කුරුණෑගල සහ මොනරාගල දිස්ත්‍රික් කාර්යාල විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා යන්ත්‍ර කුලියට දී ලබාගත් මුදල වූ රු. 1,256,497 ක ආදායම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | යන්ත්‍රෝපකරණ කුලිය ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කරවාගත යුතුය. | 2020 අගෝස්තු වනවිට කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයට අදාලව පොදු තැන්පත් වල රඳවා තිබූ ශේෂයෙන් රු.588,485 ක ශේෂය මේ වන විට ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇති අතර, ඉතිරි ශේෂය වන රු. 251,650 ක ශේෂය කඩිනමින් ප්‍රධාන කාර්යාලයට පියවීමට කටයුතු කරන බව දිස්ත්‍රික් කාර්යාලය විසින් දන්වා ඇත. 2020 අගෝස්තු 31 දින වන |

| | | | |
|---|---|---|---|
| | | | විට මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය විසින් රු.209,592 ක මුදලක් නිරවුල් කර ඇති අතර, තව දුරටත් ඉතිරිව පවතින රු.206,770 ක ශේෂය මුදල ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම සඳහා අදාළ රික්විෂන් පත්‍ර මේ වන විට ගිණුම් අංශය වෙත ලැබී ඇති බව අදාළ දිස්ත්‍රික් කාර්යාලය විසින් දන්වා ඇත. |
| (ඉ) | කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ අපහරණය කළ යුතු භාණ්ඩ වෙන්දේසියක් සිදුකර ලබාගත් මුදල වූ රු.1,558,750 ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට ප්‍රධාන කාර්යාලයට නොයවා පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අපහරණ ආදායම ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කරවාගත යුතුය. | 2020 අගෝස්තු 31 දින වනවිට රු.654,150 ක් වන ශේෂය නිරවුල් කර ඇති අතර, ඉතිරි මුදල වන රු.904,600 ක් වන ශේෂයෙන් රු.787,150 ක මුදලක් ප්‍රධාන කාර්යාලය වෙත එවීමට කටයුතු කරන අතර, රු.117,450 ක් වන ශේෂ මුදල කිතලව ගොවිජන සේවා කාරක සභාව වෙත ගෙවීමට කටයුතු කරමින් පවතින බව කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය විසින් දන්වා ඇත. |
| (ඊ) | කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ 2019 වර්ෂයේදී ට්‍රැක්ටර් සහ කෘෂි උපකරණ වත්කම් අපහරණ ආදායම රු.5,533,250 ක් ගොවිජන සංවර්ධන අරමුදලට බැර නොකොට පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. එම තත්ත්වය හේතුවෙන් අරමුදලේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | ගොවිජන සංවර්ධන අරමුදලට අයත් ආදායම් එම අරමුදලට බැර කළ යුතුය. | 2019 වර්ෂයේ අපහරණය කරන ලද ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ වත්කම් අපහරණය ආදායම් සම්බන්ධව නැවත සොයා බැලීමෙන් පසු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (උ) | 2017 අප්‍රේල් 24 දින ඌරුමුත්ත රලපනාව ඇළ බැම්ම, පොතුකැටිය අමුණ හා මහපන්විල දවටගහදෙනිය අමුණු ඇළ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිභාර අරමුදලින් ලද රු. 995,849 ක මුදලින් අදාළ කාර්යය සිදු නොකර මාතර දිස්ත්‍රික් කාර්යාලයේ තෙවන පාර්ශවය සඳහා ගෙවීම් සඳහා වූ පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු සිදු කළ යුතුය. | ගොවීන්ගේ භාරකාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ එක් ව්‍යාපෘතියක් අවසන් කිරීමට නොහැකි වී ඇති අතර එම වසමට අයත් ගොවි සංවිධානය විසින් එම ව්‍යාපෘතිය (අමුණ) ආරම්භ කළ ස්ථානයේ ඉදිකිරීම සම්බන්ධයෙන් විරෝධතාවක් දක්වා ඇති බැවින් එය ඊට මීටර් 100 ක් පමණ දුරින් ඉදිකළ යුතු බවට යෝජනා වී ඇත. ඒ සඳහා ඇස්තමේන්තු සකස් කොට ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බැවින් එම මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති බව මාතර දිස්ත්‍රික් කාර්යාලය විසින් දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2019 අගෝස්තු 28 දින වැව්ගම පුබුදු ව්‍යාපෘතිය යටතේ වැව්වල පහළ කොටස් ඉදිකිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචිකිරීමේ හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයෙන් වවුනියාව දිස්ත්‍රික් කාර්යාලයට ලද රු.8,000,000 ක මුදල 2020 මාර්තු වන විටත් අදාළ කාර්යය සඳහා යොදවා නොගෙන පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | වැව්ගම පුබුදු ව්‍යාපෘතිය යටතේ යෝජිත කාර්යයන් සිදු කළ යුතුය. | මෙහි සඳහන් වැව්ගම පුබුදුව ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට වවුනියාව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන අතර මේවන විට එම ව්‍යාපෘතියේ වැඩසටහන් කීපයකට රු. මිලියන 5.2 කට වැඩි මුදලක් ගෙවා අවසන්ව ඇත. ඉතිරි වැඩ ලබන වසර දක්වා සිදු කිරීමට නියමිත බැවින් ඒ වන තෙක් අදාළ ගෙවීම් පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තැබීමට සිදු වනු ඇති බව වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය විසින් දැනුම් දී ඇත. |
| (එ) | ගොවි බැංකු මගින් ගොවීන්ට ලබාදුන් ණය නොගෙවීම මත අධිකරණයේ නඩු පැවරීමෙන් රු.1,508,527 ක ණය මුදලක් අය කරගෙන තිබූ අතර එම ණය මුදල අදාළ ගොවි බැංකුවලට ලබා නොදී අම්පාර හා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අය කළ බැංකු ණය අදාළ ගොවි බැංකුවලට ලබාදිය යුතුය. | ගොවි බැංකු වෙත දන්වා ඇති අතර මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් නොමැති බැවින් එම මුදල පොදු තැන්පත් ලේඛනයේ ශේෂව පවතින බව ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් දැනුම් දී ඇත. 2015 සිට 2017 වර්ෂය දක්වා වූ රු. 586,276 ක මුදල සම්බන්ධයෙන් පරීක්ෂා කරන අතර මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලබන බව අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් දැනුම් දී ඇත. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල 17 ක් විසින් දිස්ත්‍රික්කවලට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 328 කින් එකතුව රු. 83,798,770 ක මුදලක් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාගෙන තිබුණි. ඇතැම් ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් රු. 1,000,000 ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් ලබාගෙන ඇති බවද නිරීක්ෂණය විය. එමෙන්ම 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් පියවා නොතිබුණු අතර එදිනට බැරකම්වලටද එකී වටිනාකම් ඇතුළත් කරනොතිබුණි. | ගොවිජන සේවා කාරක සභා පනත යටතේ පිහිටවූ ස්වාධීන ආයතන වන බැවින් දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් රු.83,798,770 ක මුදල ආපසු එම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ප්‍රතිපූර්ණය කළ යුතුය. | මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාල මගින් හේතු විමසා මගේ අංක 7/5/15-05 හා 2020 සැප්තැම්බර් 10 දිනැතිව තොරතුරු ඉල්ලා ඇත. ගොවිජන සේවා කාරක සභාවේ කටයුතු පවත්වා ගැනීම සඳහා දරනු ලබන වියදම් හැර අනෙකුත් සියලුම වියදම් සඳහා වියදම් කිරීමට කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු බවටත්, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් විධිමත් චක්‍රලේඛයක් නිකුත් කරන බවටත් දන්වා මගේ අංක 7/5/15- 05 සහ 2020 සැප්තැම්බර් 03 දිනැති ලිපිය මගින් සියලුම දිස්ත්‍රික් නි.කො/ස.කො සහ සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කර ඇත. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක 118-2-3-37-2506 දරන වැය විෂය යටතේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් වැව් 80 ක් හා අමුණු 100 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.200,000,000 ක් වෙන් කර තිබුණු නමුත් වැව් හා අමුණු සංවර්ධනය සිදු නොකර එම ප්‍රතිපාදනයෙන් රු.196,857,957 ක් 2018 වර්ෂයේ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යයට පමණක් උපයෝජනය කළ යුතුය. | නව කර්මාන්ත ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු වූ අතර එම ප්‍රතිපාදන 2018 වර්ෂයේ බිල්පත් ගෙවීම සඳහා යොදාගෙන ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැව් දහසයි ගම් දහසයි වැඩසටහන යටතේ වැව් 100 ක් හා අමුණු 100 ක් අලුත්වැඩියා කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක 118-2-3-40-2506 දරන වැය විෂය යටතේ රු. 700,000,000 ක් වෙන් කර තිබුණු නමුත් එම වැව් හා අමුණු අලුත්වැඩියාව සිදු නොකර එම ප්‍රතිපාදනයෙන් රු. 609,642,901 ක් 2018 වර්ෂයේ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක් උපයෝජනය කළ යුතුය. | නව කර්මාන්ත ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු වූ අතර එම ප්‍රතිපාදන 2018 වර්ෂයේ බිල්පත් ගෙවීම සඳහා යොදාගෙන ඇති බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවි භාර අරමුදලෙන් ලැබුණු ප්‍රතිපාදනවලින් සිදු කළ ඇස්තමේන්තුගත පිරිවැය රු. 10,029,428 ක් වූ වැව්, ඇළමාර්ග සහ පැති බැමි පුනරුත්ථාපන ව්‍යාපෘති 07 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට රු. 1,429,200 ක් වැයකර තිබුණද එම ව්‍යාපෘති 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ගොවි භාර අරමුදලෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා යොදවා ඉලක්කගත දිනට වැඩ නිම කළ යුතුය. | නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාරුක් ඇළ දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ ගෙවා නිමි අගය මත ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට අදාළ ගොවි සංවිධානය කටයුතු කර ඇති අතර එසේ කිරීමට හේතු වී ඇත්තේ 2019 වර්ෂයේ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙනි. ගොවි භාරකාර අරමුදල යටතේ ඉටුකරන ලද අනෙක් ව්‍යාපෘති 06 ක වැඩ කටයුතු අයහපත් කාලගුණය හේතුවෙන් 2019 වර්ෂයේ අවසන් කිරීමට නොහැකි වී ඇති අතර නමුත් එම ව්‍යාපෘති සඳහා මේ වන විට අවසන් ගෙවීම් ද ගෙවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශයෙන් රු. 373,500,000 ක ප්‍රතිපාදන ලබාගෙන උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්කවල සුළු වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති 106 ක් නිම කිරීම 2019 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද වර්ෂය තුළ එයින් රු.143,770,451 ක් වැය කර ව්‍යාපෘති 53 ක් පමණක් නිමකර තිබුණි. මීට අමතරව 2018 වර්ෂයේ නිමකිරීමට යෝජිතව තිබුණු එහෙත් 2019 වර්ෂයේ නිම කළ ව්‍යාපෘති 12 ක් සඳහා මෙම ප්‍රතිපාදනවලින් රු. 24,281,876 ක් වැයකර තිබුණි. | ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා උපයෝජනය කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඉ) | බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්කවල කුඩා වැව්, අමුණු හා ඇළවේලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 08 ක් සඳහා රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශය ලබාදුන් රු. 5,300,000 ක ප්‍රතිපාදන යොදාගෙන එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යයට උපයෝජනය කළ යුතුය. | 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ඉටු කිරීමට නොහැකි වී ඇත්තේ වර්ෂය පුරා පැවති අයහපත් කාලගුණය නිසා ගොවි සංවිධාන සඳහා ව්‍යාපෘති ඉටු කිරීමට පැවති අපහසුතාවය හේතුවෙනි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. 2,332,500 ක් වූ ව්‍යාපෘති 06 ක් සඳහා රාජ්‍ය ව්‍යවසාය කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශය ලබාදුන් ප්‍රතිපාදනවලින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු. 2,253,194 ක් වැයකර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ ව්‍යාපෘති ඉලක්කගත දිනට උපයෝජනය කර නිම කළ යුතුය. | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කළද එම ව්‍යාපෘති 2019 වර්ෂයේ ක්‍රියාත්මක කර නොමැත. |
| (උ) | 2019 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා අංක 001-2-6-11-2503 වැය විෂය යටතේ රු.1,732,500 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම මුදලින් රු. 362,000 ක් පමණක් වැයකර තිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යයට උපයෝජනය කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඌ) | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ නානවිල පුරන් කුඹුරු යායේ ඇළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා වෙන්කර තිබූ රු.932,500 ක ප්‍රතිපාදනවලින් රු.362,000 ක් වැය කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදන උපයෝජනය කර අදාළ ව්‍යාපෘතිය ඉලක්කගත දිනට නිම කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (එ) | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රු. 800,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු කෑගල්ල දිස්ත්‍රික්කයේ අමුණු සහ ඇළවේලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 03 ක් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කර නොතිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදන උපයෝජනය කර ඇළ, අමුණු සහ ඇළවේලි ප්‍රතිසංස්කරණයන් ඉලක්කකගත දිනට නිම කළ යුතුය. | ඇස්තමේන්තු සකස් කළ ව්‍යාපෘති කිහිපයක් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 5/2019 අනුව ප්‍රතිපාදන ඉතුරු කළ යුතු බැවින් ප්‍රතිපාදන නැවත පවරා ගන්නා ලද අතර තවත් ව්‍යාපෘති කිහිපයක් වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ඉටු කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නිලධාරීන් 17 ක් විසින් අවස්ථා 253 කදී ලබාගත් රු.4,769,898 ක අත්තිකාරම් පියවීම සඳහා දින 13 සිට දින 271 දක්වා කාලයක් ගතකර තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම කර නියමිත කාලය තුළදී පියවාගත යුතුය. | දිගින් දිගටම අතපසුවීම් වලක්වා ගැනීම සඳහා DAD/FIN/PAY/3 අංක දරන 6/22/2020 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර ඇති අතර එහි සඳහන් කරුණු ඉතා තදින් ක්‍රියාත්මක කරන ලෙස අදාළ අංශවලට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) නිලධාරීන් 05 ක් විසින් අවස්ථා 10 කදී ලබාගත් අත්තිකාරම් රු. 104,134 ක් මුදලින් පියවීමේදී දින 06 සිට දින 207 ක කාලයක් ගතකර තිබූ අතර එයින් නිලධාරීන් 02 ක් ලබාගත් රු. 48,000 ක මුදලක් දින 07 ක් හා දින 14 ක කාලයක් අත රඳවාගෙන සම්පූර්ණ මුදල නැවත ආපසු පියවා තිබුණි. | අත්‍යාවශ්‍ය කරුණකට හැර අත්තිකාරම් නිකුත් නොකළ යුතුය. | දිගින් දිගටම අතපසුවීම් වලක්වා ගැනීම සඳහා DAD/FIN/PAY/3 අංක දරන 6/22/2020 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර ඇති අතර එහි සඳහන් කරුණු ඉතා තදින් ක්‍රියාත්මක කරන ලෙස අදාළ අංශවලට උපදෙස් ලබා දී ඇත. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුමේ ඇතුළත්ව තිබුණු රු.3,534,159 ක වටිනාකමැති චෙක්පත් 192 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුමේ ඇතුළත් රු.1,812,287 ක් වටිනා චෙක්පත් 59ක් මේ වන විට නිරවුල් කර ඇති අතර දිස්ත්‍රික් කාර්යාල වල චෙක්පත් නිරවුල් කිරීමට මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. |
| (ආ) දිස්ත්‍රික් කාර්යාල 02 ක බැංකු සැසඳුම්වල හඳුනා නොගත් රු.110,775 ක ගෙවීම් තිබුණු අතර, ඒවා හඳුනා ගෙන මුදල් පොතට ගැලපීම් කර නොතිබුණු අතර එම චෙක්පත් මාස 06 සිට වර්ෂ 04 ට වැඩි කාලයක සිට පැවතුණි. | බැංකු සැසඳුම්වල හඳුනා නොගත් ශේෂ හඳුනාගෙන මුදල් පොතට ගැලපීම් කළ යුතුය. | පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ රු.47,000 ක හඳුනා නොගත් ගෙවීම් ලෙස සඳහන් වන්නේ කීඩා හානි වන්දි ලෙස ගෙවිය යුතු මුදල වෙනුවෙන් බැංකුව විසින් ද්වී ගෙවීමක් සිදු කිරීමයි. 2020 ජුනි මස වන විට මෙම ගෙවීම බැංකුව විසින් නිවැරදි කර ඇත. |

| | | |
|---|---|---|
| | | යුධ කටයුතු හේතුවෙන් කිලිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය 2008 දෙසැම්බර් 31 දින ගිණුම් කටයුතු අවසන් කරන ලදි. එහි කටයුතු 2010 වර්ෂයේ ආරම්භ කළ පසු රු. 63,775 ක් හඳුනා නොගත් ගෙවීම් ලෙස බැංකු සැසඳුමේ පෙන්නුම් කෙරේ. පැවති යුධමය තත්වය හේතුවෙන් ලිපි ලේඛන විනාශ වී ඇති බැවින් බැංකුව හෝ දිස්ත්‍රික් කාර්යාලය සතුව මේ පිළිබඳව විස්තර නොමැති බව සඳහන් වේ. එම නිසා මුදල් රෙගුලාසි 109 අනුව මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වූ කාර්යභාරයන් 06 ක් ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත නිමැවුම් මට්ටම ඉන් සියයට 65 ක් පමණක් ලබාගෙන තිබුණු අතර රු. 1,965,061,804 ක මුදලක් ද ඉතිරිව තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති සැලසුම් කළ පරිදි සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) 2019 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල මාර්ගගත (Online) දත්ත පාදම අනුව සමස්ත භෞතික ප්‍රගතිය 2019 දෙසැම්බර් 31 දිනට සියයට 82 ක් වූ අතර දිස්ත්‍රික්ක දත්ත පාදම නිසි පරිදි යාවත්කාලීන නොකරන බවද නිරීක්ෂණය විය. එසේම සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නියමිත කාලය තුළ අවසන් නොකරන බවද නිරීක්ෂණය විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති සැලසුම් කළ පරිදි සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

### 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු.10,338,000 ක් වූ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දින | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති | කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 02 එකම ගොවි සංවිධානයකින් |

| | | |
|---|---|---|
| වන විට රු.4,474,985 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘතිවලින් එක් ව්‍යාපෘතියක් නිම කළ යුතු දිනය ඉක්මවා මාසයක් ප්‍රමාද කර නිම කර තිබුණු අතර තවත් ව්‍යාපෘති 04 ක් 2020 මැයි 30 දින වන විටත් නිමකර නොතිබුණි. | සැලසුම් කළ පරිදි සිදු කළ යුතුය. | ඉටු කිරීම හා වර්ෂය පුරා පැවති අයහපත් කාළගුණ තත්ත්වය හේතුවෙන්ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 02 වර්ෂා තත්ත්වයන් හේතුවෙන් මෙන්ම මුදල ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතියේ වර්ෂයේ පැවති අයහපත් කාළගුණය හේතුවෙන්ද වැඩ අවසන් කිරීමට නොහැකි වී ඇත. |

### 3.3 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු.204,628,881 ක් වූ ව්‍යාපෘති 69 ක් වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.45,965,962 ක් වැය කර තිබුණි. මෙයින් කාල පමාවකින් පසුව ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 21 ක් නිම කළ යුතු දිනය ඉක්මවා මාස 01 සිට 05 ක් දක්වා කාලයක් ප්‍රමාද කර නිම කර තිබුණි. එසේම 2020 මැයි 30 දින වන විටත් ව්‍යාපෘති 48 ක වැඩ සිදු කෙරෙමින් තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති සැලසුම් කළ පරිදි සිදු කළ යුතුය. | නියමිත කාලයට ව්‍යාපෘති වැඩ ආරම්භ කිරීමට ප්‍රධාන වශයෙන්ම කාලගුණ තත්වයන් මෙන්ම ප්‍රසම්පාදන ප්‍රමාදයන් මෙන්ම ඇස්තමේන්තු වෙනස් වීම් හේතුවන බවත් එලෙස කාල පමාවකින් පසුව ආරම්භ කරන ව්‍යාපෘති නියමිත කාලයට වැඩ අවසන් කිරීමට නොහැකි වන බව කාරුණිකව දන්වා සිටිමි. |

### 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2020 ජනවාරි 30 දිනැති අංක PED/RED/COPA/2019/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2016, 2017, 2018 සහ 2019 වර්ෂවලට අදාළව කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | නියමිත දිනට කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | 2016, 2017 හා 2018 වර්ෂවල කාර්යසාධන වාර්තාවන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOA/AD/EA/05/ කාර්යසාධන වාර්තාව 2016 හා 2020/09/09 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබුණු අතර ඒ අනුව අදාළ වාර්තා මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 2019 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2020 ජූලි 21 වන දින අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් රු.1,579,332 ක වැය කර ඉදිකළ පානදුර බොජුන්හලට පිවිසීමට තරප්පු පෙළක් ඉදිකර නොතිබුණි. පසුව පානදුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කමිටු අරමුදලින් රු. 197,000 ක් වැයකර තරප්පු පෙළක් ඉදිකර තිබුණද 2020 ජුනි 07 දින වන විටත් බොජුන්හළ විවෘත නොකර අභාවිතව පැවතුණි. | අප්‍රමාදව බොජුන්හළ විවෘත කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර ව්‍යාපෘතිය විසින් සුනාමි සමයේ ගුවන් මගින් ජීප් රථයක් ගෙන්වා තීරු බදු නොගෙවා වාහනය ධාවනය කර ගොවිජන හා වනජීවී අමාත්‍යාංශයට ලබා දී තිබුණි. පසුව මෙම දෙපාර්තමේන්තුවට 2015 වර්ෂයේදී භාර දී තිබුණු මෙම රථය ලියාපදිංචිය සිදුකර ධාවනය නොකර එම වර්ෂයේ සිටම මාලබේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි. | අදාල ජීප් රථය ලියාපදිංචි කර ධාවනයට ගත යුතුය. | එක්සත් ජාතීන්ගේ ආයතනය විසින් මෙම රථය සුනාමී සමයේ ගුවන් මගින් ගෙන්වා තීරු බදු නොගෙවා ධාවනය කර ගොවිජන හා වනජීවී අමාත්‍යාශයට භාර දී ඇත. පසුව ගර්හිත තත්ත්වයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. CR-0098 දරන රථය සම්බන්ධව මාගේ 7/6/4/1/ CR-0098 හා 2019 සැප්තැම්බර් 23 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂක, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙතින් මෙම රථයේ රු.3,664,055 ක තීරුබදු ගාස්තු ගෙවා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් පැතූ අතර, ඊට පිළිතුරු වශයෙන් දන්වා එවා තිබුණේ තීරු බදු ගාස්තු සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තුවට අයත් රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර පියවර ගන්නා ලෙසය. මාගේ 7/6/4/1/ CR-0098 හා 2019 දෙසැම්බර් 02 දිනැති ලිපිය මගින් ඒ සම්බන්ධව උපදෙස් පතා ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලිපියක් යවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවට අයිතිය හිමි නොවූ VA – 2490, VA- 2489 අංක දරන යතුරුපැදි 02 ක් සහ වාහන 13 ක් මාලඹේ රථවාහන අංගනය තුළ පවතින අතර මෙම වාහන අදාළ ආයතන වෙත භාරදීමට හෝ පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අදාළ ආයතන වෙත භාරදීමට හෝ පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | මාලඹේ රථාංගනයේ පවතින වාහන අදාළ ආයතන වෙත භාර දීමේ හා පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ඈ) | දෙපාර්තමේන්තුව සතු මාලඹේ රථවාහන අංගනය තුළ ධාවනය නොකරන වාහන 29 ක් හා යතුරුපැදි 03 ක් පවතින අතර එම වාහනවලින් ඇතැම් වාහන වර්ෂ 15 කට අධික කාලයක සිට අලුත්වැඩියා සිදුකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් පැවතුණු බව නිරීක්ෂණය විය. | අලුත්වැඩියා සිදුකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | මාලඹේ රථාංගනයේ වාහන ගාල් කරනු ලබන්නේ වසර 25 ක පමණ කාලයක සිට වන අතර ඉඩම් අමාත්‍යාංශයට අයත් මොටර් රථ 02 හා රජයේ සැපයුම් දෙපාර්තමේන්තුවට අයත් ලොරි රථයත් හැර අන් සියලු වාහන මාලඹේ රථාංගනයට ගෙනවිත් වසර 02 -05ක් පමණ වේ. ඒවා අපහරණය කිරීම සඳහා ගාල් කර ඇත. තවද ජපානයේ නිෂ්පාදිත ලොරි රථ කිහිපයක් රියදුරන් නොමැතිකමින් හා අලුත්වැඩියා තත්ත්වයෙන් ගාල් කර ඇති අතර ඒවාද ඉදිරි කාලයේදී අලුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කර ඇත. |
| (ඉ) | දෙපාර්තමේන්තුව සතු යාන්ත්‍රික අංගනවල පැවති කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ 35 න් 07 ක් 2019 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි. ඉතිරි යන්ත්‍ර 28 ඌන උපයෝජිතව පැවති අතර ක්‍රියාකර ඇති මුළු යන්ත්‍ර පැය ගණන 8,968 ක් විය. | මීටර් නොමැති යන්ත්‍රවල පැය ගණනය සඳහා පිළිගත හැකි ක්‍රමයක් යොදාගත යුතු අතර අලුත්වැඩියා කළ යුතු යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතා කිරීම හා වැඩිකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | යාන්ත්‍රික අංගනවල පවතින යන්ත්‍ර 02 ක මීටර් පැය සටහන් වීමට මීටර් නොමැත. එසේම අලුත්වැඩියා තත්වයේ පවතින යන්ත්‍ර මෙන්ම වාර්ෂික අයහපත් කාළගුණ තත්වයන්, ව්‍යාපෘති සඳහා යන්ත්‍ර යොදාගැනීමේ අපහසුතාවයන් හා ව්‍යාපෘති සඳහා යන්ත්‍ර ඉල්ලීම් අවම වීම් හේතුවෙන් මෙලෙස ඌන උපයෝජන තත්වයන් ඇති වේ. |
| (ඊ) | 1977 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ පොහොර ගබඩා 17 ක් අවභාවිතව පැවතුණි. | පොහොර ගබඩා ක්‍රියාකාරී තත්ත්වයට ගත යුතුය. | අලුත්වැඩියා තත්වයේ පවතින පොහොර ගබඩා පැවතීම හා පොහොර වෙනුවට මුදල් ගොවීන් සඳහා ලබා දීමේ ක්‍රමවේදය නිසා පොහොර ගබඩා භාවිතා කිරීම අඩුවීමට හේතු වී ඇත. |
| (උ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 21 ක ට්‍රැක්ටර් 96 ක්, ට්‍රේලර් 21 ක්, ගොයම් කපන යන්ත්‍ර 83 ක්, තරාදී 24 ක්, පැළ සිටුවන යන්ත්‍ර 03 ක්, ධාන්‍ය පියලි කිරීම් යන්ත්‍ර 07 ක්, වතුර පොම්ප 29 ක්, බලවේග ඉසින යන්ත්‍ර 16 ක්, නැමි නඟුළු / කොකු නඟුලු 53 ක්, තණකොළ කපන | වත්කම් දිරාපත් වීමට ප්‍රථම අපහරණ කිරීමට කටයුතු කළ යුතුය. | ට්‍රැක්ටර් සහ කෘෂි උපාංග අපහරණය කිරීම සඳහා මේ වන විට තක්සේරු මණ්ඩල පත් කර අපහරණය සඳහා කටයුතු කරමින් පවතින අතර මෙම වර්ෂය වන විට බැහැර කිරීමට යෝජිත යන්ත්‍ර උපකරණ අපහරණය කඩිනමින් |

| | | |
|---|---|---|
| යන්ත්‍ර 03, රොටවේටර් යන්ත්‍ර 06 ක් ආදී වත්කම් වර්ෂ 06 සිට වර්ෂ 24 ක කාලයක සිට අක්‍රියව, අභාවිතව පැවති බව නිරීක්ෂණය විය. | | අවසන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය අනුව ඇප තැබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 9,540 ක් ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප මුදල් ලබා ගත යුතුය. | රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම සම්බන්ධයෙන් මගේ අංක 7/5/15-05 සහ 2020 ජූනි 25 දිනැතිව 8/2020 චක්‍රලේඛය මඟින් නිලධාරීන් දැනුවත් කර ඇති අතර මගේ අංක 7/5/15-05 සහ 2020 ජූලි 06 දිනැති ලිපිය මගින්ද මේ වන විට නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

## 3.7 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත 2019 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 25 ක් සඳහා 2020 අගෝස්තු 18 දින දක්වාම පිළිතුරු එවා නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ විගණන විමසුම්වලට පිළිතුරු ලබාදිය යුතුය. | 2020 සැප්තැම්බර් 15 දිනට විගණන විමසුම් 25 ක් සඳහා පිළිතුරු ලබාදීමට පවතී. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූලික විමර්ශන 62 ක් සඳහා වාර්තා කැඳවා ඇතත් ඒ සඳහා මාස 06 සිට වර්ෂ 09 ක කාලයක් ගත වී තිබුණද වාර්තා ලැබී නොතිබුණි. තවද විධිමත් විනය පරීක්ෂණ 97 ක් පවත්වා වාර්තා ලබාගැනීම හා විනය නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 02 සිට 08 දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. | අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය වන හෙයින් නොපමාව සියලු පරීක්ෂණ අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. | මෙහි දක්වා ඇති මූලික විමර්ශන අතුරින් ලිපිගොනු 07 ක මූලික විමර්ශන වාර්තා මේ වන විට ලැබී ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. මීට අමතරව, මූලික විමර්ශනයන් සඳහා පත් කළ නිලධාරීන් ඇතැම් රාජකාරීන් මත වාර්තාව ලබා දීම සඳහා දින දීර්ඝ කර ලබා ගැනීම මෙලෙස වාර්තා ලබා දීමට ප්‍රමාදවීම් සිදුව |

| | | | |
|---|---|---|---|
| | | | ඇත. මෙම වාර්තා කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. මෙමගින් විමසීම් කර ඇති විධිමත් විනය පරීක්ෂණ 17 ක වාර්තා මේ වන විට ලැබී ඇත. ලිපිගොනු 11 ට අදාළව විනය නියෝග මේ වන විට නිකුත් කර ඇත.මෙම ලිපි ගොනු වලට අදාළව නිකුත් කරන ලද විනය නියෝගයන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ගොනු 03 කට අදාළව නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ පාඩු හා හානි ලේඛනයේ වර්ෂ 14 ක කාල සීමාවක සිට පැවත එන අලාභ ශේෂයන් පැවතුණි. | පාඩු හා හානි සම්බන්ධව පවත්නා අසාමාන්‍ය ප්‍රමාදය වලක්වා ගැනීම සහ සිදුව ඇති අලාභය වහාම අයකර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | කළුතර දිස්ත්‍රික්කයේ බදුරලිය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව රාජකාරී කරන ලද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙකු බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියට මුදාහැර තිබූ කාලයට අදාළව ගෙවන ලද රු.321,728 ක වැටුප රු.100,000 ක මුල් වාරිකයකින් හා සමාන වාරික 06 කින් ආපසු අයකර ගැනීමට ගොවිජන කොමසාරිස් ජනරාල් විසින් 2019 පෙබරවාරි 21 දින අනුමත කර තිබුණද 2020 අගෝස්තු 18 දින වන විටත් එම නිලධාරියාගෙන් රු.126,773 ක් අයවීමට පැවතුණි. | මුදාහැර තිබූ කාලයට අදාළ ගෙවූ වැටුප් හා දීමනා හැකි ඉක්මනින් අදාළ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතුය. | අය විය යුතු මුදල පියවීම සඳහා ඔහු 2019 සැප්තැම්බර් 27 දින සිට මුදලින් රු.158,000 ගෙවා ඇති අතර, 2020 මැයි හා ජූලි මස වල දී රු.36,954 ක මුදලක් ඔහුගේ වැටුපෙන් අය කරගෙන ඇත. 2020 අගෝස්තු 18 දිනට රු.126,773 ක ශේෂයක් තිබුණද 2020 අගෝස්තු මස වැටුපෙන් රු.18,122 ක මුදලක් ඒ සඳහා අයකර ගෙන ඇති අතර, දැනට පවතින ශේෂය රු. 108,600 ක් වේ. |
| (ඈ) | 2014 සිට 2018 දක්වා මුදල් රෙගුලාසි 104 යටතේ සිදුකරන ලද පරීක්ෂණවලට අනුව නිලධාරීන් 15 කගෙන් අයවිය යුතු රු.7,809,976 ක මුදල අයකර ගැනීමට 2019 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු සිදුකර නොතිබුණි. | අසාමාන්‍ය ප්‍රමාදයක් බැවින් නොපමාව මෙම මුදල් අයකර ගත යුතුය. | ගොනු 08 පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2016 වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලද රු.148,282 ක මුදලක්, ව්‍යාපෘතිය හඳුනා නොගෙන වර්ෂ 04 කට ආසන්න කාලයක් පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අඛණ්ඩව පසු විපරම් කර තැන්පතු ඉක්මනින් නිරවුල් කළ යුතුය. | එහි සඳහන් මුදල වන රු.148,282 ක මුදල 2020 ජූනි 29 දින පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත ගෙවා ඇත. |
| (ඊ) | 2017 දෙසැම්බර් 04 දින අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ සපුමල්ගස්කඩවැව හා කුඩාදික් වැව ප්‍රතිසංස්කරණය සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලද රු. 4,156,615 ක් අදාළ කාර්යය සිදු නොකර වර්ෂ 02 කට ආසන්න කාලයක් අභාවිතව පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි | -එම- | ප්‍රතිසංස්කරණ කටයුතු 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණද වවුනියා දිස්ත්‍රික් සීමා මායිම් නිර්ණය කිරීමේ දී ඉහත වාරි කර්මාන්තය මඩුකන්ද ගොවිජන සේවා බලප්‍රදේශයෙන්, කැබිතිගොල්ලෑව ගොවිජන සේවා බල ප්‍රදේශයට වෙනස් වී ඇත. මේ හේතුවෙන් කොටස් මුදල් ලබා ගැනීමේ දුෂ්කරතාවය මත ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් 2018 අප්‍රේල් 15 දින දක්වා දීර්ඝ කර ඇත. නමුත් එහි ප්‍රතිසංස්කරණ කටයුතු මෙතෙක් නිම කිරීමට ගොවි සංවිධානය කටයුතු කර නොමැත. ඒ අනුව, කුඩා දික් වැව කර්මාන්තයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් නොවීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකි වූ මුදල වූ රු.4,156,615 ක මුදල ආපසු අරමුදලට ගෙවා ඇත. |
| (උ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 97 ක ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකර නොමැති බව නිරීක්ෂණය විය. එසේම ඇතැම් ගොවිජන සේවා මධ්‍යස්ථානවල ඇඟිලි සළකුණු යන්ත්‍ර යොදා තිබුණද තාක්ෂණික ගැටළු නිසා වාර්තා ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකර ඒවා මඟින් පැමිණීම සහ පිටවීම වාර්තා කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඌ) | රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ තිරසාර කෘෂිකර්ම ජල කළමනාකරණ ව්‍යාපෘතිය (2005-2018) මගින් රු.400,000 ක වටිනාකම වූ සූර්යබල ජල සූක්ෂම පද්ධති ගෙවීමේ පදනම මත ගොවීන් | ණය මුදල් අයකර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | 09 දෙනෙක් වෙත ලබා දී තිබුණි. එම ණය මුදල් නියමිත කාලයේදී අයකර ගෙන නොතිබුණු බැවින් 2019 දෙසැම්බර් 31 දින වන විට ගොවීන් 09 කගෙන් රු.3,273,478 ක් අයවිය යුතුව පැවතුණි. එසේම 2020 ජූලි 10 දින වන විට මෙම පද්ධති 09 න් 06 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | | |
| (එ) | කෘෂිකර්ම ඉඩම් ප්‍රතිශෝධන වැඩසටහන යටතේ 2020 ජූලි 18 දින විටත් දිස්ත්‍රික්ක 21 ක කුඹුරු ඉඩම් ලේඛන සහතික කර ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | කුඹුරු ඉඩම් ලේඛන සහතික කර ඉදිරිපත් කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඒ) | දිස්ත්‍රික් කාර්යාල 14 ක ගොවි බැංකුව විසින් නිකුත් කරන ලද ණය වර්ග 13 ක් සඳහා ගොවීන් 17,895 කින් 2019 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ රු.297,372,717 ක ණය ශේෂයක් අය කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ණය මුදල් අයකර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඔ) | දිස්ත්‍රික් කාර්යාල 04 ක් හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 237 ක් පවත්වාගෙන යන ඉඩම් අක්කර 259 ක් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඕ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 406 ක 2018 දෙසැම්බර් 31 දිනට සකස් කළ මූල්‍ය ප්‍රකාශන අනුව දීර්ඝ කාලයක සිට පැවත එන රු. 532,689,579 ක වටිනාකමැති අයවිය යුතු ශේෂ 4,355 ක් පැවතුණි. යථෝක්ත ණය ශේෂ නැවත අය කරගැනීමට දිස්ත්‍රික් කාර්යාල හා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණයගැති ශේෂ නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017, 2018 හා 2019 වර්ෂ වල දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ මහජන පැමිණිලි හා ඉල්ලීම්වලින් පිළිවෙලින් 422, 478 හා 326 ක් විසදා නොතිබූ බව නිරීක්ෂණය විය. | පැමිණිලි නොපමාව අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. | මහජන පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධව ක්‍රියා කරනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් හා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීන් විසිනි. අප විසින් කරනු ලබන්නේ කොමසාරිස් ජනරාල් වෙත යොමු වන ඉල්ලීම් හා පැමිණිලි එක් එක් දිස්ත්‍රික්ක වෙත යොමු කිරීමත්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් විසින් ඉල්ලා සිටින පරිදි අවශ්‍ය අනුමැතීන් හා උපදෙස් දීමයි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුළත් වූ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පෞද්ගලික පඩිනඩි හා නඩත්තු වියදම් දැරීම, මූලධන වත්කම් කර ගැනීම හා ප්‍රසම්පාදන පුනරුත්ථාපනය කිරීම සඳහා වියදම, ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමට අදාළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා වියදම් දැරීම, අලුත්වැඩියා කටයුතු, වැව් ප්‍රතිසංස්කරණ කටයුතු හා පුනරුත්ථාපනය කිරීම හා සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය, ගොවිජන සංවර්ධන අරමුදලේ ලැබීම් හා ගෙවීම් පරීක්ෂාව, මධ්‍යස්ථාන අවසාන ගිණුම් යනාදී අරමුණු සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. අභ්‍යන්තර විගණන අංශය සඳහා සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික්කාර්යාල 19 ක වැටුප් හා ගමන් වියදම් වෙනුවෙන් දරන ලද රු. 13,180,787 ක් විය. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල විගණන සැලැස්මට ඇතුළත් කළ යුතුය. | පෙන්වා ඇති කාර්යයන් සඳහා වෙන්කර ඇති පැය ප්‍රමාණය 2,192 ක් වුවත්, එය විගණන සැලැස්ම සංශෝධනයට පෙර දක්වා ඇති පැය ප්‍රමාණයි. 2019 වර්ෂයේ විගණන සැලැස්ම 2019 ඔක්තෝබර් 19 දින පැය ප්‍රමාණය 1,128 ක් ලෙස සංශෝධනය කෙරුණි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 3,534 ක් වූ අතර තනතුරු 10 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාවෙන් එක් සේවකයෙකුවත් බඳවාගෙන නොතිබුණි. | කොමසාරිස් (පරිපාලන හා මානව සම්පත්), කොමසාරිස් (සේවා) සහ 2020 ඔක්තෝබර් මාසයේ විශ්‍රාම යාමට නියමිත කොමසාරිස් (සංවර්ධන) තනතුරු ඇතුළු සියලු අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවිය යුතුය. | දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් 2018 හා 2019 වර්ෂවලදී පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. පවතින පුරප්පාඩු වලින් කොටසක් 2020 වර්ෂයේද තවත් කොටසක් 2021 වර්ෂයේ පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. මේ වන විට, ගොවිජන සංවර්ධන නිලධාරීන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විභාගයට අදාළ කටයුතු සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම යොමු කර ඇත. තවද, තාක්ෂණ නිලධාරීන් පුරප්පාඩු පිරවීම සඳහා ද අවශ්‍ය කටයුතු මේ දිනවල සිදු කරමින් සිටී. |
| (ආ) | දෙපාර්තමේන්තු බඳවාගැනීමේ පරිපාටිය අනුව කොමසාරිස් තනතුරුවලට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පත්කළ යුතු වුවද කොමසාරිස් සේවා, පරිපාලන හා මානව සම්පත් තනතුරු සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් වැඩ බැලීමට පත්කර තිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | මේ වන විට, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ තනතුරු වන කොමසාරිස් (සේවා) හා කොමසාරිස් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) තනතුරු දෙක සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු පත්කර දෙන මෙන් දිගින් දිගටම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපි මඟින් ඉල්ලීම් යොමු කළද, තවමත් එම තනතුරු වල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බැවින්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු එම තනතුරුවල වැඩ බැලීමට පත්කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිවයින පුරාගොවි බැංකු 555 ක් වූ අතර ගොවි බැංකු නිලධාරීන් සහ සහකාර ගොවි බැංකු නිලධාරීන් ඇතුළු සියළු තනතුරු පුරප්පාඩුව පැවතුණි. ගොවි බැංකු කටයුතු සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් යොදවා තිබුණු අතර එම හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානවල වසම් කීපයකට එක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවකු බැගින් යොදවා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | අත්‍යාවශ්‍ය තනතුරු පිළිබඳ විධිමත් විමර්ශනයක් කර පුරප්පාඩු පිරවීමට කටයුතු කර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වසම්වලට අනුයුක්ත කිරීම. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි බැංකු නිලධාරීන් සහ සහකාර ගොවි බැංකු නිලධාරීන් තනතුරේ පුරප්පාඩු සඳහා අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අමාත්‍යාශය වෙත යවා ඇති අතර, එවායේ සංශෝධන සඳහා නැවත අප වෙත යොමු කර ඇත. මේ වන විට, එම සංශෝධන කටයුතු සිදු කරමින් සිටී. එතෙක් ගොවිජන සේවා මධ්‍යස්ථානවල වසම් කීපයක රාජකාරී කටයුතු සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් යොදවා ඇත. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්කවල සේවය කරන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුව යාවත්කාලීන නොවීම නිසා සේවය ස්ථිර කිරීම, වැටුප් වාර්ෂික උසස්වීම් ආදී කටයුතු ප්‍රමාද වී ඇති අතර එම නිසා එම නිලධාරීන් උසස්වීමේදී, විශ්‍රාම යෑමේදී හා විවිධ අවස්ථාවන්හිද ගැටලුකාරී තත්ත්වයට මුහුණදීමට සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |